AL/2026/32/S/I

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது / All RightsReserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා ඒකීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව , 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) –கற்றலுக்கான உதவி மதிப்பீடு , 2026
General Certificate of Education (Adv. Level) Supportive Assesment , 2026

ව්‍යාපාර අධ්‍යයනය வணிகக் கல்வி **Business Studies**	**I** **I** **I**	**32**	**S**	**I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස් :

* **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේම** සපයන්න
* **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* උත්තර ප්‍රශ්න අංක **01** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න
* සෑම ප්‍රශ්නයකටම ලකුණු **දෙක** බැගින් හිමිවේ.

විභාග අංකය : .....

1. අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයින් පදනම් කරගන්නා විවිධ ක්‍රම වුවමනා වන අතර වුවමනා සඳහා විසඳුම වන්නේ.

(1) මුදල් ය. (2) කැමැත්ත ය. (3) නිෂ්පාදිත ය.
(4) වෙළෙඳපොළ ය. (5) ව්‍යාපාර ය. (.....)

2. භාණ්ඩ හුවමාරුව ව්‍යාපාර විකාශනයේ එක් අවස්ථාවකි. ඒ සඳහා පදනම වූයේ,

(1) පුද්ගල විශේෂීකරණයයි. (2) අතිරික්ත නිෂ්පාදනයයි. (3) සෘජු නිෂ්පාදනයයි.
(4) ශ්‍රම විභජනයයි. (5) වක්‍ර නිෂ්පාදනයයි. (.....)

3. කුලී පදනම මත වාහන සපයන (Rent a car) “ස්පීඩ් වේ” ආයතනය තම ව්‍යාපාරය පුළුල් කිරීමට සිදුකළ පරිසර විශ්ලේෂණයක දී පහත පරිසර බලවේග හඳුනාගෙන ඇත.

A. ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා රජය බදු සහන ලබා දීම
B. දියුණු ආචාර ධර්ම පද්ධතියක් පැවතීම
C. මැද පෙරදිග යුද්මය වාතාවරණයක් පැවතීම
D. සමාජය තුළ කුලී පදනමට වාහන ලබා ගැනීමේ ප්‍රවණතාවක් පැවතීම
E. ආයතනය සතුව ජනප්‍රිය වූ ජංගම දුරකථන යෙදවුමක් (mobile app) පැවතීම
F. ඉන්ධන මිල අඛණ්ඩව ඉහළ යාම
G. දක්ෂ පළපුරුදු රියදුරන් කිහිප දෙනෙකු විදේශගත වීම

ඉහත බලවේග අතුරෙන් ව්‍යාපාරයේ ශක්ති සහ තර්ජන අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) AD සහ EG (2) CF සහ AC (3) BD සහ FG
(4) BC සහ EF (5) BE සහ CF (.....)

4. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සමාජ වගකීම් කිහිපයකි

A. සාධාරණ ඉපයීමක් ලබා දීම
B. හරිත නිෂ්පාදිත බිහිකිරීම
C. සමානාත්මතාව
D. ප්‍රජා සත්කාර සේවා
E. ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම
F. සාධාරණ වීම

ඉහත සමාජ වගකීම් අතුරෙන් සේවකයන් හා ගනුදෙනුකරුවන් කෙරෙහි ඉටු කළ යුතු සමාජ වගකීම් අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) A හා F (2) C හා E (3) B හා D
(4) C හා F (5) D හා E (.....)

5. පහත සඳහන් වන්නේ රජයේ ආර්ථික ක්‍රියාකාරකම් කිහිපයකි.

1. වාණිජ බැංකු භාණ්ඩාගාර බිල්පත් සඳහා ගෙවන වට්ටම් අනුපාතය ඉහළ දැමීම.
2. ආනයනික අර්තාපල් සඳහා රජය පනවන බදු අනුපාතය ඉහළ දැමීම.
3. කුරුණෑගල සිට මහනුවර දක්වා අධිවේගී මාර්ගය දිර්ඝ කිරීමට රජය මුදල් වෙන් කිරීම.
4. මහ බැංකුව එක් දින ප්‍රතිපත්ති පොළී අනුපාතිකය ඉහළ දැමීම.
5. සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර සඳහා රාජ්‍ය බැංකු හරහා අඩු මිලට ණය පහසුකම් ලබා දීම.
6. රජය මෝටර් රථ ආදායම් බලපත්‍ර ගාස්තු ඉහළ දැමීම.

ඉහත දැක්වෙන ආර්ථික ක්‍රියාකාරකම් අතුරෙන් රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය සහ පිස්කල් ප්‍රතිපත්තියට අදාළවන ක්‍රියාකාරකම් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 1, 4, 5 සහ 2, 3, 6
(2) 1, 2, 3 සහ 4, 5, 6
(3) 2, 3, 4 සහ 1, 5, 6
(4) 1, 4, 6 සහ 2, 3, 5
(5) 2, 3, 6 සහ 1, 4, 5 (.....)

6. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් ණය සීමා පැනවීම සිදුකරයි. පහත දැක්වෙන ණය සීමා අතුරෙන් ප්‍රමාණාත්මක ණය සීමා පැනවීමක් වන්නේ කවරක්ද ?

(1) කෘෂිකර්මාන්තයට ලබාදෙන ණය ප්‍රමාණය සීමා කිරීම
(2) දේපොළ ණය සඳහා උපරිම සීමා පැනවීම
(3) වාණිජ බැංකු පවත්වාගත යුතු සංචිත අවශ්‍යතා ඉහළ දැමීම
(4) ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා සපයන ණය වෙනුවෙන් ඇප කොන්දේසි දැඩි කිරීම
(5) කර්මාන්ත ණය සඳහා ණය ගෙවීමේ උපරිම කාලය අඩු කිරීම (.....)

7. පහත ලක්ෂණ අතුරෙන් හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් **පමණක්** දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) අඛණ්ඩ පැවැත්මක් තිබීම
(2) නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
(3) පොදු එකඟතාවක් පැවතීම
(4) ගිණුම්කරණ කටයුතු අනිවාර්ය නොවීම
(5) ව්‍යාපාරය නමින් බදු ගෙවීමක් සිදු නොවීම (.....)

8. සාංගමික ව්‍යවස්ථාවලියේ අන්තර්ගත තොරතුරක් වන්නේ,

(1) පෞද්ගලික සමාගමක් ද පොදු සමාගමක් ද යන වග
(2) සමාගම පිහිටි දිස්ත්‍රික්කය
(3) සමාගමේ කොටස්කරුවන් සංඛ්‍යාව
(4) සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්
(5) සමාගමේ ලේකම්වරයා පිළිබඳ තොරතුරු (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

9. පාසල් උපකරණ නිෂ්පාදනය කරන ආයතනයක් පාසල් උපකරණ අලෙවිකිරීමේ ව්‍යාපාරයක් හා සංයෝජනය වීම හඳුන්වන්නේ,

(1) ඒකාබද්ධ වීම ලෙස ය.
(2) තිරස් සංයෝජනය ලෙස ය.
(3) විෂම සංයෝජන ලෙස ය.
(4) සිරස් පසුපස සංයෝජන ලෙස ය.
(5) සිරස් ඉදිරිපස සංයෝජන ලෙස ය. (.....)

10. පහත ගති ලක්ෂණවලින් ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් **නොවන්නේ**,

(1) අවදානම් දැරීමේ හැකියාව
(2) නව අදහස් උත්පාදනය කිරීම
(3) වෙනස්වීම් සඳහා ප්‍රතිචාර නොදැක්වීම
(4) අඛණ්ඩව තම අරමුණු ඉටු වෙනතුරු ක්‍රියා කිරීම
(5) අන් අයගේ අදහස් මත යැපෙන්නෙකු නොවීම (.....)

11. ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දීමේ ප්‍රධාන අරමුණ සඳහන් පිළිතුර තෝරන්න.

(1) අඩු ආදායම්ලාභී පවුල් සඳහා පරිභෝජන ණය ලබා දීම.
(2) සාම්ප්‍රදායික බැංකු සේවා මගින් ලබාගත නොහැකි අඩු ආදායම්ලාභීන්ට ව්‍යාපෘති මූල්‍ය සහන ලබාදීමයි.
(3) ඉතා සුළු වටිනාකම් සහිත ණය පහසුකම් අවශ්‍ය ඕනෑම පුද්ගලයකුට ලබාදීමයි
(4) පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා සුළු පරිමාණයෙන් ණය ලබාදීමයි
(5) මධ්‍යම පාන්තික ආදායම් උපයන්නන්ගේ ආර්ථික අපහසුතා තුරන් කිරීමේ සඳහා ණය පහසුකම් ලබාදීමයි (.....)

12. මූල්‍ය ආයතන කිහිපයක් සහ එම මූල්‍ය ආයතන පිළිබඳ කෙටි හැඳින්වීමක් පහත වගුවේ දැක්වේ.

	මූල්‍ය ආයතන		හැඳින්වීම
1.	ආන්තික සැපයුම්කරුවන්	A	සමාගමකට අවම සහභාගි මුදල රැස්කර ගැනීමට නොහැකි වූ විට ඉතිරි වූ සුරකුම්පත් මිලදී ගනී
2.	කොටස් ප්‍රාරක්ෂකයන්	B	නව ව්‍යවසායකයන්ට ව්‍යාපාර ආරම්භ කිරීමට ප්‍රාග්ධනය සැපයීම
3.	ආයෝජන කළමනාකරුවන්	C	මහජනතාවට කරනු ලබන සුරැකුම්පත් නිකුතුවකදී ඒ සඳහා සේවා සැපයීම
4.	ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්	D	ලැයිස්තුගත සමාගම්වල සුරැකුම්පත් මිලදී ගැනීමට ආයෝජකයන්ට අරමුදල් සැපයීම

ඉහත මූල්‍ය ආයතන දක්වා ඇති අනුපිළිවෙළ අනුව ඒවායේ හැඳින්වීම නිවැරදිව ගලපා ඇති වරණය තෝරන්න.

(1) C D B A (2) D A C B (3) D B A C
(4) C A D B (5) A B D C (.....)

13. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන කටයුතු සම්බන්ධ ප්‍රකාශ දෙකකි.

ප්‍රකාශ A : පාලක මණ්ඩලය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය අධීක්ෂණය කිරීමේ වගකීම දරයි.

ප්‍රකාශ B : පාලක මණ්ඩලය, මුදල් ප්‍රතිපත්තිය ඇතුළු පොදු ප්‍රතිපත්ති තීරණය කරයි.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ
(2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ
(3) A සහ B යන දෙකම අසත්‍ය වේ
(4) A සහ B යන දෙකම සත්‍ය වන අතර B මඟින් A පැහැදිලි කෙරේ
(5) A සහ B යන දෙකම සත්‍ය වන අතර A මගින් B පැහැදිලි කෙරේ (.....)

14. සඳුන් අල්විස් රුපියල් ලක්ෂ 90 ක් වූ තම මෝටර් රථය එම වටිනාකමට ම රක්ෂණය කර ඇත. එම මෝටර් රථයට සිදුවූ අනතුරකින් වාහනයේ දකුණු පස දොරවල් දෙකට සිදු වූ හානියේ තක්සේරු වටිනාකම රුපියල් ලක්ෂ 12 කි. රක්ෂකයාගේ නිගමන වූයේ,

A - හානි වූ දොරවල් දෙක රක්ෂණ සමාගම වෙත භාරදිය යුතු බවයි.

B - වන්දි ලෙස රුපියල් ලක්ෂ 12 ගෙවිය යුතු බවයි

ඉහත නිගමන දෙකට අදාල රක්ෂණ මූලධර්ම අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ආදේශනය සහ හානිපූර්ණය
(2) දායකත්වය සහ හානිපූර්ණය
(3) ආදේශනය සහ දායකත්වය
(4) හානිපූර්ණය සහ ආදේශනය
(5) ආසන්නතම හේතුව සහ හානිපූර්ණය (.....)

15. දියවැඩියා රෝගය සඳහා ඖෂධයක් නිෂ්පාදනය කළ ඖෂධ සමාගමක් සකස් කළ ප්‍රචාරක දැන්වීම් මඟින් එම ඖෂධය පිළිබඳව තොරතුරු දියවැඩියා රෝගීන්ට හඳුන්වා දෙන ලදී. මෙම සිදුවීමට අදාළ සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) යවන්නා, මාධ්‍ය, පණිවුඩය, ලබන්නා
(2) යවන්නා, මාධ්‍ය, ලබන්නා, පණිවුඩය
(3) යවන්නා, පණිවුඩය, ආකේතනය, ලබන්නා
(4) යවන්නා, පණිවුඩය, මාධ්‍ය, ලබන්නා
(5) යවන්නා, පණිවුඩය, මාධ්‍යය, ලබන්නා (.....)

16. ප්‍රවාහනයේ දී දැරීමට සිදුවන ඉන්ධන වියදම්, අළුත්වැඩියා වියදම්, බලපත්‍ර ගාස්තු ආදිය වෙනුවෙන් දරන පිරිවැය හඳුන්වන්නේ,

(1) පෞද්ගලික පිරිවැය ලෙස ය
(2) සමාජ පිරිවැය ලෙස ය
(3) මුළු පිරිවැය ලෙස ය
(4) ප්‍රවාහන පිරිවැය ලෙස ය
(5) ආර්ථික පිරිවැය ලෙස ය (.....)

17. පහත සඳහන් වන්නේ වෙළෙඳාමට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනෙකුගේ කාර්යයන් පිළිබඳව තොරතුරුය.

අමල් : කමල්ගේ ව්‍යාපාරයේ නිපදවන විදුලි උපකරණ මිලට ගෙන සිය නාමය යටතේ අලෙවි කරයි.

රනිල් : කුසල්ගේ ව්‍යාපාරයේ නිෂ්පාදනය කරන ඇඟළුම් ණයට විකිණීම සිදුකර එම ණය මුදල්ද කුසල්ට එක්රැස් කර දෙයි.

අමල් සහ රනිල් යන දෙදෙනාම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය සහිත පිළිතුර තෝරන්න.

(1) අමල් තැරැව්කරුවෙකු වන අතර රනිල් සාධකයෙක් වේ
(2) අමල් හා රනිල් දෙදෙනාම කැපකරු නියෝජිතයන් වේ
(3) අමල් සාධකයෙකු වන අතර අනිල් කොමිස් නියෝජිතයෙකු වේ
(4) අමල් හා රනිල් දෙදෙනාම සාධකයන් වේ
(5) අමල් සාධකයෙකු වන අතර රනිල් කැපකරු නියෝජිතයෙකු වේ (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

18. විදේශ වෙළෙඳාමට සම්බන්ධ තීරු බදු නොවන බාධක සහ එම බාධක සඳහා නිදසුන් පහත වගුවේ දැක්වේ.

තීරු බදු නොවන බාධක	නිදසුන්
1. ආනයන සීමා කිරීම 2. අපනයන පංගු කිරීම 3. ආනයන තහනම් කිරීම 4. වෙළෙඳ ගිවිසුම්	A. GSP+ සහනය ශ්‍රී ලංකාවට ලබා දීම B. රජය විසින් රසායනික පොහොර ආනයනය නතර කිරීම C. තේ අපනයනය සඳහා ශ්‍රී ලංකාව රුසියාව සමඟ එකඟ වීම D. වසරකට වාහන 10000 ක් පමණක් ආනයනයට අවසර ලබා දීම

මෙම තීරු බදු නොවන බාධක අදාල නිදසුන් සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) 1A 2B 3C 4D
(2) 1D 2B 3C 4A
(3) 1D 2A 3B 4C
(4) 1A 2C 3D 4B
(5) 1D 2A 3C 4B (.....)

19. පහත දැක්වෙන්නේ ආයතනයක සාර්ථකත්වය සඳහා ඉදිරිපත් වී ඇති යෝජනා කිහිපයකි.

A. ආයතනයක් විසින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම
B. විදේශ වෙළෙඳපොළ සඳහා නව භාණ්ඩයක් ඉදිරිපත් කරමින් වෙළෙඳපොළ වර්ධනය කර ගැනීම
C. ගනුදෙනුකරුවන් සඳහා ලෝයල්ටි වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් දීර්ඝ කාලීන ගනුදෙනුකරුවන් තහවුරු කර ගැනීම
D. නිමි භාණ්ඩවල ගුණත්වය තහවුරු කිරීම සඳහා නව තත්ත්ව පාලන පද්ධතියක් හඳුන්වා දීම
E. සේවක නොපැමිණීම් පාලනය කිරීම සඳහා නම්‍යශීලී කාර්යාල වේලාවන් හඳුන්වාදීම
F. සුපිරි වෙළෙඳසැල් කවුන්ටරයේ මිල ගණනය කිරීමේදී තීරු සංකේතනය හඳුන්වා දීම

ඉහත යෝජනා අතුරෙන් ආයතනයේ ඉහළ කාර්යක්ෂමතාව සඳහා ඉදිරිපත් වී ඇති යෝජනා පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, F (2) A, B (3) C, D (4) A, E (5) D, B (.....)

20. ආයතනයක සේවක අභිප්‍රේරණය සඳහා යොදා ගන්නා ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - කොටස් හිමිකාරිත්වය ලබා දීම
B - සේවකයන් ඇගයීම
C - උසස්වීම් ලබා දීම
D - ප්‍රසාද දීමනා ලබා දීම
E - සේවක සවිබල ගැන්වීම
F - ආයතනයේ නිෂ්පාදිත සහන මිලට ලබා දීම

ඉහත අභිප්‍රේරණ ක්‍රම මූල්‍යමය සහ මූල්‍යමය නොවන ලෙස පිළිවෙලින් වර්ග කර ඇති පිළිතුර කුමක්ද?

(1) A, B, C සහ D, E, F
(2) A, B, D සහ C, E, F
(3) A, D, F සහ B, C, E
(4) B, C, E සහ A, D, F
(5) A, D, E සහ B, C, F (.....)

21. නිෂ්පාදන ආයතනයක රස කැවිලි නිෂ්පාදනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- නිෂ්පාදන ධාරිතාව මසකට ඒකක 2400 කි
- ඒකකයක විකුණුම් මිල රුපියල් 30 කි
- ඒකකයක විචල්‍ය පිරිවැය ඒකකයක විකුණුම් මිලෙන් 20 % කි
- ස්ථාවර පිරිවැය රුපියල් 4800 කි

ඉහත තොරතුරු අනුව මෙම ආයතනයේ සමච්ඡේදන ලක්ෂයේ ඒකක සංඛ්‍යාව වන්නේ,

(1) ඒකක 100 (2) ඒකක 160 (3) ඒකක 180
(4) ඒකක 200 (5) ඒකක 800 (.....)

22. කම්හල් පිරියත සැලසුම් වර්ග හා ඒවායේ විස්තර පහත වගුවේ දැක්වේ.

කම්හල් පිරියත සැලසුම් වර්ග	විස්තරය
I. ක්‍රියාවලි පිරියත II. නිෂ්පාදිත පිරියත III. කුටි පිරියත IV. ස්ථාවර ස්ථානීය පිරියත	A. - නිෂ්පාදන ක්‍රියාවලියේ දී එක සමාන යන්ත්‍ර හා විෂම යන්ත්‍ර වෙන වෙනම කුටිවල සවිකර නිෂ්පාදන කටයුතු ගලා යන ආකාරයට පිරියත සකස් කිරීම. B. - නිෂ්පාදන ක්‍රියාවලියේ එක් අදියරක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු දේ එක් ස්ථානයක සිදුවන ආකාරයට පිරියත පිළියෙළ කිරීම. C. - අමුද්‍රව්‍ය, ශ්‍රමය, බලය, උපකරණ ආදී යෙදවුම් නිෂ්පාදනය සිදු කරන ස්ථානයටම ගෙනවිත් නිෂ්පාදනය සිදුකිරීමට පිරියත සැලසුම් කිරීම. D. - සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය එක් කාර්ය ස්ථානයකින් ඊළඟ කාර්ය ස්ථානයට රේඛීයව අනුපිළිවෙළට ගලා යන ආකාරයට පිරියත සකස් කිරීම.

කම්හල් පිරියත සැලසුම් වර්ග අනුපිළිවෙල අනුව විස්තරය නිවැරදිව ගැලපූ විට දැක්වෙන වරණය තෝරන්න.

(1) A, B, C, D (2) B, D, A, C (3) D, B, A, C

(4) B, A, D, C (5) A, B, D, C (.....)

23. භාණ්ඩයක ජීවන චක්‍රයක ප්‍රධාන අදියර පහත වගුවේ A තීරුවේද එම අදියරවල දැකිය හැකි ලක්ෂණ B තීරුවේද දැක්වේ.

A		B	
1	භාණ්ඩ සංවර්ධන අදියර	P	ලාභය හීන වී අලාභ ලබයි
2	හඳුන්වාදීමේ අදියර	Q	සංවර්ධන හා පර්යේෂණ වියදම් දරයි
3	වර්ධන අදියර	R	විකුණුම් සහ ලාභ ස්ථාවර මට්ටමක පවතී
4	පරිණත අදියර	S	ලාභය ශූන්‍ය මට්ටමක පවතී
5	පිරිහෙන අදියර	T	භාණ්ඩය වේගයෙන් වෙළඳපොළ පිළිගනියි.

A තීරුවේ අනුපිළිවෙල අනුව B තීරුව නිවැරදිව ගැලපූ විට දැක්වෙන පිළිතුර වන්නේ

(1) STRQP (2) RSTQP (3) QRSTP (4) QPRST (5) QSTRP (.....)

24. සංඛ නවීන මෝස්තර අනුව කොණ්ඩ කැපීම සහ කොණ්ඩ සැකසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. තමන් වෙත පැමිණෙන ඒ ඒ ගනුදෙනුකරුට ගැලපෙන පරිදි සේවා සැපයීමෙන් ඔවුන්ට වටිනාකමක් නිර්මාණය කිරීම සහ දිගුකාලීන සම්බන්ධතා ගොඩනැගීමට නිරන්තරයෙන් කටයුතු කරයි.

මෙම සිද්ධිය තුළින් ගම්‍යවන අලෙවිකරණ සංකල්පය වන්නේ,

(1) සාමාජීය අලෙවිකරණ සංකල්පය
(2) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය
(3) විකුණුම් සංකල්පය
(4) ගනුදෙනුකරු සංකල්පය
(5) අලෙවිකරණ සංකල්පය. (.....)

25. එක්තරා සමාගමක ජංගම අනුපාතය 2.5 ක් වන අතර ක්ෂණික අනුපාතය 0.5 කි. මේ අනුව මෙම සමාගමේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් එකඟ විය හැකි ප්‍රකාශය තෝරන්න.

(1) ඉහළ ලාභයක් වාර්තා වන බවය
(2) තොගවල ආයෝජනය ඉහළ අගයක් ගන්නා බවය
(3) මූල්‍ය තත්වය යහපත් මට්ටමක පවතින බවය
(4) ආයෝජකයන්ට ප්‍රමාණවත් ප්‍රතිලාභ හිමි නොවන බවය
(5) ජංගම වගකීම් ඉහළ අගයක් ගන්නා බවය (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

26. පහත වගුවේ X තීරුවේ මෙරට මූල්‍ය ක්‍රමය තුළ පවතින ගෙවීම් හා පියවීම් පද්ධති ද Y තීරුවේ එම පද්ධතිවල සුවිශේෂී ලක්ෂණ ද සඳහන් වේ.

X	Y
1. තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) 2. ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය (CTS) 3. නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය. 4. ජගත් අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන සංගමය. (SWIFT)	A. චෙක්පත් නිශ්කාශන ක්‍රියාවලිය වේගවත්ව සිදුවේ. B. ආරක්ෂිතව සහ වේගවත්ව මුදල් හුවමාරුව සඳහා බැංකු තොරතුරු හුවමාරුවට භාවිතා කරයි. C. එක් එක් ගනුදෙනුව වෙන වෙනම ඒ මොහොතේම පියවීමට යොදා ගනී. D. ගනුදෙනු හිමිකම් සහ පියවීම් සියල්ල ඉලෙක්ට්‍රොනිකව සිදුවේ.

X හා Y තීරු ගලපු විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) 1A, 2B, 3C, 4D

(2) 1D, 2A, 3C. 4B

(3) 1C, 2A, 3D, 4B

(4) 1B, 2C, 3D, 4A

(5) 1D, 2C, 3B, 4A (.....)

27. සේවක ආකර්ෂණ ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A. කුසලතා ඉන්වෙන්ට්‍රි

B. රැකියා දැන්වීම් පුවරු

C. අතීත සේවකයන් මඟින්

D. අනුප්‍රාප්තික සැලැස්ම

E. වෘත්තීය සංගම් මඟින්

F. රැකියා නියෝජිත ආයතන මගින්

ඉහත ආකර්ෂණ ක්‍රම අතුරෙන් අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම ඇතුළත් වරණය කුමක්ද ?

(1) ABC (2) CEF (3) BEF

(4) CDE (5) ABD (.....)

28. සේවකයන් වැඩ කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හා යන්ත්‍ර සූත්‍ර ක්‍රියා විරහිත කිරීමෙන් වැඩ නතර කිරීම හඳුන්වන්නේ,

(1) වැඩවල නොයෙදීම ලෙස ය.

(2) අකුරට වැඩ කිරීම ලෙස ය.

(3) කඩාකප්පල් කිරීම ලෙස ය.

(4) වැඩ මග හැරීම ලෙස ය.

(5) උපවාස කිරීම ලෙස ය. (.....)

29. බිස්කට් නිෂ්පාදන ආයතනයක අලෙවිකරණ අංශය පාරිභෝගික තෘප්තිය පිළිබඳව සිදුකළ සමීක්ෂණයකින් ලබාගත් තොරතුරු භාවිත කර මානව සම්පත් කළමනාකරණ අංශය විසින් ආයතනයේ වෙබ් අඩවියේ වෙළෙඳ දැන්වීමක් පල කරන ලදි.

මෙම සිද්ධියේ සඳහන් තොරතුරු වර්ගීකරණය කළ හැකි ආකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) නියත, සම්භාවිතාත්මක

(2) මූලික, ද්විතීයික

(3) සමූහගත, වෙන් කරන ලද

(4) වර්තමාන, අනාගත

(5) මූල්‍ය, මෙහෙයුම් (.....)

30. ව්‍යාපාර සැලැස්මක වැදගත්කම පිළිබඳව සලකා බැලූ විට නොගැලපෙන පිළිතුර වන්නේ,

(1) මූල්‍ය පහසුකම් ලබා ගැනීමට වැදගත් වේ

(2) සේවකයන් ආකර්ෂණය කර ගැනීමට වැදගත් වේ

(3) රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමේදී වැදගත් වේ

(4) ව්‍යාපාරයේ කාර්ය සාධනය ඇගයීමට වැදගත් වේ

(5) ඇල්මැති පාර්ශ්වයන්ට තොරතුරු ලබා ගැනීමට වැදගත් වේ. (.....)

ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න

31. (අ) සංවිධානය තුළ සිටින එයට බලපෑම් කරන කණ්ඩායම් හා තත්ත්වයක් ව්‍යාපාරයක වර්ධනය තුළින්..... පරිසරය ලෙස ද ව්‍යාපාරයක පුළුල් වටපිටාව සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම් ..... පරිසරය ලෙසද හඳුන්වයි.

(ආ) ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදිතය අඛණ්ඩව ඉහළ යාම ..... ලෙස හඳුන්වන අතර, ඊට අමතරව මානව හා සමාජ දර්ශකවල දිගුකාලීන වර්ධනය ..... ලෙස හඳුන්වයි.

32. (අ) සමූපකාර ව්‍යාපාරයට ..... පාලනයක් පවතින අතර එහි අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම සාමාජික ..... මත පදනම් වේ.

(ආ) ව්‍යවසායකයෙකු නව ව්‍යාපාර ..... හඳුනා ගැනීමට ..... විශ්ලේෂණයේ නිරත වේ.

33. (අ) ඒකක භාරවලදී අවදානම ..... කිරීම සඳහා ඒකක හිමියන්ගේ අරමුදල් ආයෝජන ..... ආයෝජනය කරනු ලබයි.


(ආ) සන්නිවේදන ක්‍රියාවලිය සම්පූර්ණවීමට නම් ලබන්නාගේ ..... යවන්නාට ..... විය යුතුය.

34. (අ) ගොඩනැගිල්ලක ප්‍රමාණය වැඩි නොකර ගබඩා ධාරිතාව වැඩි කර ගැනීම සඳහා අමතර ..... ක්‍රමය යොදා ගත හැකි අතර අමතර ආධාරකයක් නොමැතිව විශාල භාණ්ඩ ප්‍රමාණයක් එකවර ගබඩා කිරීම සඳහා භාණ්ඩ ..... ලෙස ඇසිරීම සිදු කරයි.

(ආ) භාණ්ඩවල මිල ඩිජිටල් ලෙස පෙන්වන ක්‍රමය ..... ලෙස හඳුන්වන අතර සමාජ මාධ්‍ය ජාලා තුළින් සිදු කරන අලෙවිකරණය ..... ලෙස හඳුන්වයි.

35. (අ) අපේක්ෂිත තත්වයත්, පවතින තත්ත්වයත් අතර වෙනසක් පවතින විට එය .... ලෙසද, විකල්ප අතුරින් තෝරාගත් හොඳම විකල්පය ..... ලෙසද හඳුන්වනු ලැබේ.

(ආ) පාලන ක්‍රියාවලියේ පියවර ඇසුරෙන් පිළිතුරු සපයන්න



36. (අ) නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව කරගෙන යාම සඳහා ..... මට්ටමින් හා ..... පිරිවැයක් යටතේ තොග පවත්වා ගැනීම තොග පාලනය ලෙස හැඳින්වේ.

(ආ) ආයතනයක තොග සම්බන්ධ ..... අවම වන පරිදි වරකට ඇණවුම් කළ යුතු තොග ඒකක ප්‍රමාණය ..... ලෙස හැඳින්වේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

37. (අ) සන්නිවේදන මාධ්‍ය අතරින් තමා භාවිත කරන සන්නිවේදන මාධ්‍ය කෙතරම් විෂය පථයක් ආවරණය වනවාද යන්න පිළිබඳව ව්‍යාපාරිකයාගේ දෘෂ්ටිය, ... ලෙස අදහස් කරන අතර, සන්නිවේදන මාධ්‍ය කෙරෙහි පාරිභෝගිකයා කෙතරම් දුරට අවධානය යොමු කරන්නේද, එසේම සක්‍රිය ලෙස සම්බන්ධ වන්නේ ද යන්න ලෙස ..... ලෙස අදහස් කරයි.

(ආ) භාණ්ඩ අලෙවිකරණ මිශ්‍රයට සාපේක්ෂව සේවා අලෙවිකරණ මිශ්‍රයට අමතරව අයත්වන විචල්‍යයන් ලෙස ..... , ... භෞතික වටපිටාව සඳහන් කළ හැකිය.

38. (අ) අනාගතයේදී නිශ්චිත මිලකට සමාගමක කොටස් මිලට ගැනීමේ අයිතිය ලබා දෙමින් නිකුත් කරන ලියවිල්ල ..... ලෙස හඳුන්වන අතර, එමගින් ආයෝජකයෙකු ලබන ප්‍රතිලාභය වන්නේ ..... යයි.

(ආ) සමාගමක දැනට සිටින කොටස්කරුවන් ඔවුන්ගේ කොටස්වලින් යම් ප්‍රමාණයක් මහජනයාට අලෙවි කිරීමට කොටස් වෙළඳපොළෙහි ..... මඟින් ලියාපදිංචි වීම සිදු කල හැකි අතර, මෙහිදී සමාගමේ..... වැඩිවීමක් සිදු නොවේ.

39. (අ) කිසියම් රැකියාවක් වඩාත් නිවැරදි ව කිරීමට සේවකයන් තුළ දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමේ කටයුත්තක් ලෙස සේවක ..... හැඳින්විය හැකි අතර, එමඟින් ..... රැකියාවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සිදුවේ.

(ආ) සංවිධානයක් සිය සේවාදායකයන්ට සේවා නියුක්තිය උදෙසා සෘජුවම ගෙවනු ලබන ගෙවීම ..... නමින් හඳුන්වන අතර ..... ගෙවනු ලබන්නේ සේවා දායකයන්ගේ විශිෂ්ට කාර්යඵල සඳහාය.

40. (අ) දැනුම් මට්ටමේදී භාවිත කරන තොරතුරු පද්ධති දෙකක් ලෙස ..... හා ..... දැක්විය හැක.

(ආ) ව්‍යාපාර සැලැස්මක ප්‍රධාන කරුණු සාරාංශකොට ..... මඟින් ඉදිරිපත් කරන අතර, ... තුළ ව්‍යාපාරය කුමක්ද යන්න හා ව්‍යාපාරය සපයන සේවා පිළිබඳ විස්තර කරයි.

ප්‍රශ්න අංක 41 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

41. ව්‍යාපාරික කාර්යයන් හතරක් සඳහන් කරන්න

(1) .....

(2) .....

(3) .....

(4) .....

42. රාජ්‍ය අංශය මඟින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට හේතු හතරක් සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

43. ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොමැතිවීම යන හේතුව හැර චෙක්පතක් අගරුවන අවස්ථා හතරක් දක්වන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

44. විදේශ වෙළෙඳාමේ දී ශ්‍රී ලංකාව ගිවිසුම්ගත වී ඇති ආසියාතික ද්වීපාර්ශීය වෙළෙඳ ගිවිසුම් හතරක් දක්වන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

45. කළමනාකරණය යනු කුමක්දැයි හැඳින්වීමට භාවිතා කරන පුළුල් අර්ථකථනය තුළ ඇති සංකල්ප හතරක් සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

46. ශ්‍රම ඵලදායිතාව හා ද්‍රව්‍ය ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර දෙක බැගින් සඳහන් කරන්න.

ශ්‍රම ඵලදායිතාව	ද්‍රව්‍ය ඵලදායිතාවය
1.	1. .....
2.	2. .....

47. ව්‍යාපාරයකට නිෂ්පාදිත මිශ්‍රයක් (Product Mix) පවත්වාගෙන යාමට හේතු හතරක් සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

48. ව්‍යාපාරිකයෙකුට මූල්‍ය සාක්ෂරතාව (Financial Literacy) ප්‍රගුණ කිරීම තුළින් අත්කර ගත හැකි ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

49. රැකියා ඇබෑර්තුවක් පිරවීම සඳහා ඉතාම සුදුසු පුද්ගලයා තෝරාගැනීමට භාවිතා කරන ක්‍රම හතරක් දක්වන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

50. විද්‍යුත් මූල්‍ය වංචා වළක්වා ගැනීමට ගත හැකි ආරක්ෂිත පියවර හතරක් සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / *முழுப் பதிப்புரிமையுடையது* /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව , 2026

கல்விப் போதுத் தராதரப் பத்திர (உயர் தரப்) கற்றலுக்கான உதவி மதிப்பீடு , 2026

General Certificate of Education (Adv. Level) Supportive Assessment, 2026

ව්‍යාපාර අධ්‍යයනය **வணிகக் கல்வி** **Business Studies**	**II** **II** **II**	**32**	**S**	**II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - **10 minutes**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදන්න

උපදෙස් :

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න

I කොටස

I. සුධාර තම පියාගේ අඩි පාරේ යමින් මැණික් පතල් කර්මාන්තයට පිවිසෙන්නේ මැණික් හා පතල් කර්මාන්තය පිළිබඳ පාඨමාලාවක්ද හැදෑරීමෙන් පසුවය. දැනට පලපුරුදු සේවකයන් 15 ක් ඔහු යටතේ සේවය කරන අතර ඔහුගේ පතල්වලින් ලැබෙන මැණික් නගරයේ ස්වර්ණාභරණ වෙළෙඳසැල්වලට අලෙවි කරයි. ඔහු වටිනාකමින් වැඩි මැණික් එලෙසම දේශීය මෙන්ම විදේශීය වෙළෙඳ ප්‍රදර්ශනවලට ඉදිරිපත් කොට ඉහළ ආදායමක් ලබයි. සුධාර තමන් ලබන ලාභයෙන් කොටසක් සමාජ සුභසාධනය සඳහා ද යෙදවීමට කටයුතු කරයි.

I. (අ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව ඔහුගේ ව්‍යාපාරය අයත් වන්නේ කුමන අංශ වලටද? (ලකුණු 02 යි)

(ආ) කර්මාන්ත මූලය අනුව ඔහුගේ ව්‍යාපාරය කුමන අංශවලට අයත් වන්නේදැයි ඉහත සිද්ධියේ සඳහන් උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

II. (අ) සුධාරගේ ව්‍යාපාරයට ඇති ශක්තීන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සුධාරගේ ව්‍යාපාරයට බලපෑම් ඇති කළ හැකි තර්ජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

III. (අ) සුධාරගේ ව්‍යාපාරය ලාභ ඉපයිය යුත්තේ ඇයි දැයි සනාථ කිරීමට කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සුධාර **සමාජය** වෙනුවෙන් ඉටු කළ යුතු යැයි ඔබ යෝජනා කරන සමාජ වගකීම් හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

IV. (අ) සුධාර විසින් ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම නිසා ඔහුට අත් කර ගත හැකි ප්‍රතිලාභ හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) රජයේ ආර්ථික අරමුණු ඉටුකිරීමට සුධාර වැනි ව්‍යාපාරිකයන්ට දායක විය හැකි ආකාර හතරක් ලියන්න. (ලකුණු 02 යි)

V. (අ) ඍජු බදු හා වක්‍ර බදු යන සංකල්ප දෙක උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) සුධාර මෙම ව්‍යාපාරය තම සේවකයන් කිහිපදෙනෙකු හවුල් කර ගනිමින් හවුල් ව්‍යාපාරයක් බවට පත්කර ගතහොත් ඔවුන්ට අත් කර ගත හැකි වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20)

2. I (අ) 2007 අංක 07 දරන සමාගම් පනත අනුව ආරම්භ කළ හැකි ප්‍රධාන සමාගම් වර්ග තුනකි. ඉන් සමාගම් වර්ග දෙකක් නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) "සීමිත පොදු සමාගමක් අනිවාර්යයෙන්ම ලැයිස්තුගත සමාගමක් වේ". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද ? හේතු දක්වන්න. (ලකුණු 02 යි)

II. (අ) සීමාසහිත සමාගම් පාලනය කිරීම සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සමූපකාර ප්‍රාදේශික ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම පාහේ ව්‍යාප්තව පැවතුණත් වර්තමානයේ බොහෝ සමූපකාර ප්‍රාදේශික අපේක්ෂිත මට්ටමට සාර්ථක වී නොමැත.ඒ සඳහා බලපා ඇති කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

III. (අ) වරලත් ව්‍යාපාර පවත්වාගෙන යාමේදී වරලත්ලාභියාට පවතින සීමා හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) රාජ්‍ය අංශය පෞද්ගලික අංශය සමඟ තරගකාරී ව්‍යාපාර කටයුතු නොකර ඉන් බැහැර වීමට තීරණය කළහොත් අත්වන අහිතකර ප්‍රතිවිපාක හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

IV. (අ) ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් රටකට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කර ගත හැකි ප්‍රධාන ආකාර හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

V. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනාගැනීමට භාවිත කරන ප්‍රමාණාත්මක නිර්ණායක හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විවිධ ආයතන හා රජය මගින් සපයා ඇති විවිධ පහසුකම් වර්ග හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20)

3. I (අ) මුදලේ කාර්යයන් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) උද්ධමනකාරී තත්ත්වයක් තුළ මුදලේ කාර්යයන් හි හැසිරීම කෙබඳුද? (ලකුණු 02 යි)

II. (අ) මිල ස්ථායීතාව ලභා කර ගැනීම සඳහා මහ බැංකුව විසින් අවධානය යොමු කරන ප්‍රධාන සාධක දෙක සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය කරුණු හතරක් මඟින් පෙන්වා දෙන්න. (ලකුණු 02 යි)

III. ඔබ විසින් මිලදී ගත් භාණ්ඩ තොගයක් වෙනුවෙන් රුපියල් 85000 ක මුදලක් ලලිත් සඳරුවන් වෙත ගෙවීමට ඇත. ඔබගේ ඉතිරිකිරීමේ ගිණුම සම්පත් බැංකුව කළුතර ශාඛාවේද , ජංගම ගිණුම මහජන බැංකුව කළුතර ශාඛාවේ ද, ලලිත් සඳරුවන්ගේ ගිණුම ලංකා බැංකුව පානදුර ශාඛාවේ ද පවත්වා ගෙන යනු ලබයි.

(අ) ඉහත මුදල වෙක්පතකින් ගෙවීමට ඔබ අදහස් කරන්නේ නම් එම ගෙවීමට අදාළ ව වෙක්පතක ආකෘතියක් ඉදිරිපත් කරන්න. (උපරිම ආරක්ෂාව ලැබෙන පරිදි අදාළ නියමයන් සහිතව) (ලකුණු 02 යි)

(ආ) වෙක්පතක් පිටසන් කිරීම අවශ්‍ය වන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

IV. (අ) රක්ෂණ ගිවිසුමක් හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙක සඳහන් කරන්න. (ලකුණු 01 යි)

(ආ) "රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට රක්ෂණ මූලධර්ම මඟින් විශාල මග පෙන්වීමක් සිදු කරයි".
ඉහත ප්‍රකාශයේ සත්‍යතාවය රක්ෂණ මූලධර්ම තුනක් ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 03 යි)

V. (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන්නේ කෙසේද? කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සඵලදායී සන්නිවේදනයේ දී පණිවුඩය යවන්නා (Sender) හා පණිවුඩය ලබන්නා (Receiver) යන දෙදෙනාගේ වගකීම් කෙසේ විය යුතුද? (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

4. I (අ) "ප්‍රවාහන සේවාවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට නම් ප්‍රවාහන පද්ධතියේ මූලිකාංග කෙරෙහි සැලකිලිමත් වෙමින් කටයුතු කළ යුතුය"
ඉහත ප්‍රකාශය පිළිබඳ ඔබ එකඟ වන්නේද ? පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) අධිවේගී මාර්ග පද්ධතිය තුළ ක්‍රියාත්මක Park and Ride මගින් ආර්ථිකයට අත්වන වාසි කවරේද? (ලකුණු 02 යි)

II (අ) ගබඩාකරණ ක්‍රියාවලියේ පියවර සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සිල්ලර වෙළෙඳ කටයුතු ස්ථානීය වෙළෙඳපොළක සිදුවීමේදී නව තාක්ෂණය භාවිත කරන අවස්ථා හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

III (අ) විදේශ වෙළෙඳාමේදී භාවිත කරන පහත ලියවිලි නිකුත් කරන පාර්ශ්වය නම් කරන්න.

1. වේදිකා කුවිතාන්සිය 2. ප්‍රභවස්ථාන සහතිකය
2. ණයවර ලිපිය 4. ගුදම් බලපත්‍රය (ලකුණු 02 යි)

(ආ) නෞභාර පත්‍රය අපනයනකරුට ප්‍රයෝජනවත් වන ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

IV (අ) ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) "දේශීය වෙළෙඳාමේ නිරත වනවාට අමතරව විදේශ වෙළෙඳපොළ අවස්ථා උදාකර ගැනීමට ඇතැම් ව්‍යාපාරිකයින් කැමැත්තක් දක්වයි"
මෙලෙස විදේශීය වෙළෙඳපොළ අවස්ථා උදාකර ගැනීමෙන් ව්‍යාපාරිකයෙක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන වාසිදායක තත්ත්වයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

V මාර්ගගත (online) ක්‍රමයට වෙළෙඳ කටයුතු සිදු වීමේ දී පාරිභෝගිකයින් සහ ව්‍යාපාරිකයින් මුහුණ දෙන ගැටලු දෙක බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20)

II කොටස

5. අගනගරය ආශ්‍රිතව ආරම්භ කරන ලද ස්මාර්ට් සුපිරි වෙළෙඳ සැලෙහි කළමනාකාරීත්වය විකුණුම් හා ලාභ ඉහළ නැංවීමට සිතා නිශ්චිත සැලැස්මකින් හෝ විකුණුම් පුරෝකතනයකින් තොරව ව්‍යාපාරය පුළුල් කිරීමට ආයෝජනය කරන ලදී. වැටුප් හා දීමනා ගැනද රැකියා සුරක්ෂිතභාවය ගැනද අසතුටින් පසුවන සේවකයන් ඇතැම්විට රාජකාරී කාලය තුළ නිකරුණේ ගත කරන කාලය වැඩිවිය. මේ නිසා සේවක චිත්ත ධෛර්යය පහත වැටුණු අතර කෙටි කාලයකදී ඉහළ අලාභයක් වාර්තාගත කල මෙම සුපිරි වෙළෙඳසැල පිළිබඳ පාරිභෝගික පැමිණිලි ද වැඩිවිය.

I. (අ) ඉහත සිද්ධිය ඇසුරෙන් සංවිධානකරණයේ දුර්වලතා දෙකක් උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ව්‍යාපාරයට සැලැස්මක් සකස් කරන්නේ නම් අනුගමනය කලයුතු මූලධර්ම හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

II. (අ) ස්මාර්ට් සුපිරි වෙළෙඳ සැලට ශ්‍රම විභජනය වැදගත් වන ආකාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම සුපිරි වෙළෙඳ සැලෙහි විවිධ අංශ අතර සමායෝජනය ඵලදායී ව සිදු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

III. (අ) ස්මාර්ට් සුපිරි වෙළෙඳ සැලෙහි පැවතිය යුතු විවිධ කළමනාකරණ මට්ටම් හඳුනාගෙන ඒ ඒ කළමනාකරණ මට්ටම් සඳහා ප්‍රගුණ කළ යුතු කළමනාකරණ කුසලතා රූප සටහනක් ඇසුරින් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආයතනය තුළ මතු වී ඇති සේවක අභිප්‍රේරණ ගැටලු දෙකක් හඳුනාගෙන ඒවා මහහරවා ගැනීමට යොදාගත හැකි අභිප්‍රේරණ ක්‍රම එක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

IV. (අ) සුපිරි වෙළෙඳ සැලක් සඳහා යොදාගත හැකි වඩාත් සුදුසු පිරියත සැලසුම්කරණ ක්‍රමය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඔබ ඉහත සඳහන් කළ පිරියත සැලසුම්කරණ ක්‍රමයෙන් ව්‍යාපාරිකයාට හා පාරිභෝගිකයාට අත්වන වාසි දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

V. (අ) සුපිරි වෙළෙඳ සැලකට සුදුසු තොග පාලන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආයතනයකට තොග පාලනයේ වැදගත්කම කරුණු හතරක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

6. සිසිල් බීම නිපදවන ආයතනයක් "විටා ෆෘට්" නමින් ස්වභාවික පලතුරු වලින් සකස් කරන ලද සෞඛ්‍ය සම්පන්න පානයක් තරුණ වයසේ පසුවන ඉහළ ආදායමක් සහිත පාරිභෝගිකයන් සඳහා නිෂ්පාදනය කර අලෙවි කරන අතර, ඉතා දැඩි තරගකාරීත්වයෙන් මෙම වෙළෙඳපොළ තුළ දක්නට ලැබේ. මිල මදක් ඉහළ මෙම පානය සමාජ මාධ්‍ය හරහා ප්‍රවර්ධනය කළ ද විකුණුම්වල අපේක්ෂිත වර්ධනයක් දක්නට නොලැබුණි.

I (අ) වෙළෙඳපොළ කණ්ඩනය යන්න පැහැදිලි කර, විටා ෆෘට් අලෙවියේ දී වෙළෙඳපොළ කණ්ඩනය සඳහා යොදාගන්නා පදනම නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) විටා ෆෘට් පානයෙහි නිෂ්පාදිත මිශ්‍රයේ ගැඹුර (Depth) හා පළල (Width) වැඩි කර ගත හැකි ආකාර එක බැගින් යෝජනා කරන්න. (ලකුණු 02 යි)

II (අ) මෙම බීම වර්ගය සඳහා පදනම් වූ මිල කිරීමේ පරමාර්ථය කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) විටා ෆෘට් පානය සඳහා යොදා ගැනීමට සුදුසු ඇසුරුම් වර්ග මොනවාද ? (ලකුණු 02 යි)

III (අ) භාණ්ඩ වර්ගීකරණය අනුව මෙම බීම නිෂ්පාදනය කවර භාණ්ඩ වර්ගයකට අයත්ද ? ඔබේ පිළිතුරට හේතුව සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත ආයතනය මෙම බීම වර්ගය දැනට ප්‍රවර්ධනය සඳහා යොදා ගන්නා අලෙවි ප්‍රවර්ධනය උපක්‍රමය නම්කර ඊට අමතරව යොදාගත හැකි වෙනත් ප්‍රවර්ධන උපක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

IV (අ) මෙම බීම වර්ගයෙහි විකුණුම් අඩුවීමට හේතුවිය හැකි කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම නිෂ්පාදිතය බෙදා හැරීමට යොදා ගත හැකි ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

V (අ) මූල්‍ය කළමනාකරණයේ දී අයිතිකරුවන්ගේ ධනය උපරිම කළ යුත්තේ ඇයි දැයි හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරික ලාභය සහ ඇතිකරුවන්ගේ ධනය අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

7. I (අ) සාංගමික බැඳුම්කර සහ භාණ්ඩාගාර බැඳුම්කර අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ සිදුවන ගනුදෙනු හතරක් ලියන්න. (ලකුණු 02 යි)

II (අ) හිමිකම් නිකුතුවක් යනු කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) හිමිකම් නිකුතුවක් තුළින් ආයෝජකයාට ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

III මානව සම්පත් සැලසුම්කරණයේ දී මානව සම්පත් අතිරික්තයට හා ඌණතාවයට ගත යුතු උපාය මාර්ග තීරණය කරයි.

(අ) සේවක අතිරික්තයක දී ගත හැකි උපාය මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 01 යි)

(ආ) සේවක ඌණතාවක දී ගත හැකි උපාය මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 01 යි)

(ඉ) ආයතනයකට මානව සම්පත් සැලසුම්කරණය වැදගත් වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

IV සීමා සහිත XY සමාගමේ රැකියා පරිසරයේ, සේවක ආරක්ෂාවට තර්ජනයක් වන කාරණයක් සම්බන්ධයෙන් කුඩා සේවක කණ්ඩායමක් තුළ තිබූ කලකිරීමට නිසි විසඳුමක් නොලැබීම නිසා, එම තත්ත්වය දැඩි ගැටලුකාරී තත්ත්වයක් බවට පත්ව ඇත.

(අ) සිද්ධියේ සඳහන් මානව සම්පත් කළමනාකරණ ගැටළු දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ගැටළුව නිරාකරණය කර නොගැනීම නිසා ආයතනයට අත්විඳීමට සිදුවිය හැකි අහිතකර ප්‍රතිවිපාක හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

V සේවක වැඩ වර්ජන නිසා ආර්ථිකයට ඇති විය හැකි අහිතකර බලපෑම් හතරක් විස්තර කරන්න. (ලකුණු 04 යි)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

8. I ශ්‍රී ලංකා රජය ආර්ථිකය ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමට පියවර ගනිමින් සිටී.

(අ) ඩිජිටල් ආර්ථිකයක් (Digital Economy) යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ආ) ඩිජිටල් ආර්ථිකයකට ඇති විය හැකි අභියෝග හතරක් ලියන්න. (ලකුණු 02 යි)

II (අ) තොරතුරු තාක්ෂණය සහ තොරතුරු කළමනාකරණ තාක්ෂණය අතර වෙනස පැහැදිලි කරන්න.(ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයකට තොරතුරු තාක්ෂණය භාවිත කිරීමේ දී ඇති විය හැකි අභියෝග හතරක් ලියන්න. (ලකුණු 02 යි)

III (අ) පරිගණක ජාලයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයකට පරිගණක ජාල තාක්ෂණය භාවිතා කිරීමේ වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

IV (අ) ව්‍යාපාර සැලැස්මක අංගයක් වන අලෙවිකරණ සැලැස්ම තුළ ඇතුළත් තරඟකාරීත්ව විශ්ලේෂණයේ දී ඉදිරිපත් කළ යුතු තොරතුරු හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපෘති සාරාංශය තුළ ඇතුළත් සාරාංශගත තොරතුරු සඳහා මූලාශ්‍ර වන ලේඛන හතරක් නම් කරන්න. (ලකුණු 02 යි)

V (අ) මූල්‍ය අන්තර්ගතභාවය (Financial Inclusion) යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් යෝජනා කරන්න. (ලකුණු 02 යි)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026

General Certificate of Education (Adv. Level) Examination – 2026

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව , **2026**

උත්තර පත්‍රය - **Answer Sheet**

Business Studies I

ව්‍යාපාර අධ්‍යයනය I

උත්තර පත්‍රය

ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය
01.	3	11.	2	21.	4
02.	2	12.	2	22.	2
03.	5	13.	1	23.	5
04.	4	14.	1	24.	4
05.	1	15.	4	25.	2
06.	3	16.	1	26.	3
07.	3	17.	5	27.	5
08.	4	18.	3	28.	4
09.	5	19.	1	29.	2
10.	3	20.	3	30.	3

මුළු ලකුණු 2 X 60 = 60

31 සිට 50 දක්වා සෑම පිළිතුරකටම ලකුණු ½ බැගින් හිමිවේ.

31. (අ) අභ්‍යන්තර, සාර්ව
    (ආ) ආර්ථික වර්ධනය, ආර්ථික සංවර්ධනය
32. (අ) ප්‍රජාතන්ත්‍රවාදී, ඡන්දය / සාමාජික ඡන්දය
    (ආ) අවස්ථා, පරිසර
33. (අ) අවම,කළඹක
    (ආ) ප්‍රතිචාරය,ප්‍රතිපෝෂණය
34. (අ) තට්ටු, ගොඩවල්
    (ආ) විද්‍යුත් මිල දර්ශකය / ඩිජිටල් මිල දර්ශකය , සෘජු අලෙවිකරණය / ඩිජිටල් අලෙවිකරණය
35. (අ) ගැටළුවක්,තීරණය
    (අ) කාර්යළුල මැනීම,ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම
36. (අ) ප්‍රශස්ථ,අවම
    (ආ) මුළු පිරිවැය, ආර්ථික ඇණවුම් ප්‍රමාණය / EOQ

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

37. (අ) හැඟීම, නිරතවීම
(ආ) පුද්ගලයින්, ක්‍රියාවලිය

38. (අ) කොටස් බලපත්‍රය,ප්‍රාග්ධන ලාභ
(ආ) විකුණුම් අර්පනයක්, ප්‍රාග්ධනය

39. (අ) පුහුණුව,වර්තමාන
(ආ) චේතන / වැටුප්, දිරි දීමනා(ප්‍රෝත්සහන)

40. (අ) දැනුම කාර්ය පද්ධති (KWS), කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS)
(ආ) විධායක සාරාංශය, ව්‍යාපාර විස්තරය

41. - පරිපාලනය
- නිෂ්පාදනය
- අළෙවිකරණය
- මුල්‍ය කටයුතු
-මානව සම්පත් කටයුතු
-පර්යේෂණ හා සංවර්ධනය
-තොරතුරු කළමනාකරණ කටයුතු

42. -පෞද්ගලික අංශය විසින් අහිතකර ලාභ ඉපැයීම පාලනය කිරීමට
-ඒකාධිකාරී ආයතන බිහිවීම වැළැක්වීමට
-ජාතික ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වා ගෙන යාමට
-පොදු ජනතාවට සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට
-රජයේ සැලස්මක් හා පාලනයක් යටතේ ව්‍යාපාර කටයුතු සිදුවන බැවින් සම්පත් නාස්තිය අවම කර ගැනීමට
-ලාභ නොමැති, පෞද්ගලික අංශය ඉදිරිපත් නොවන වැදගත් මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම පවත්වා ගෙන යාමට

43. - අණකරු විසින් ගෙවීම නතර කර තිබීම.
- අණකරු බුන්වත් වීම.
- අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දැනුම් දීම.
- ගානිෂි නියෝගයක් ලැබීම.(උසාවි නියෝගයක් ලැබීම)
- ලිඛිත වැරදි.
- ගිණුම වසා තිබීම.

44. - ශ්‍රී ලංකා ඉන්දියා ද්විපාර්ශ්වික සබඳතා / ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
- ශ්‍රී ලංකා චීන සහයෝගිතා ගිවිසුම්
- ශ්‍රී ලංකා ජපාන ආර්ථික සහයෝගිතා ගිවිසුම
- ශ්‍රී ලංකා පකිස්ථාන සහයෝගිතා ගිවිසුම
- ශ්‍රී ලංකා සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම

45. - ගතික ව්‍යාපාර පරිසරය
- ආයතන / සංවිධාන
- පරමාර්ථ හා අරමුණු
- ව්‍යාපාර සම්පත්
- සළුලදායකත්වය
- කාර්යක්ෂමතාවය
- ක්‍රියාවලිය

46. <u>ශ්‍රම ඵලදායිතාවය</u>

- පුහුණු සේවකයන් යොදා ගැනීම
- සේවකයින් පුහුණු කිරීම
- මූල්‍ය හා මූල්‍ය නොවන සේවක දිරි ගැන්වීම් යොදා ගැනීම
- තත්ත්ව කව යොදා ගැනීම
- මනා සේවක සම්බන්ධතා පවත්වා ගැනීම

<u>ද්‍රව්‍ය ඵලදායිතාවය</u>

- ඉහළ තත්වයෙන් යුතු අමුද්‍රව්‍ය යොදා ගැනීම
-අපතය හා නාස්තිය අවම කර ගැනීම
-ප්‍රශස්ත තොග පවත්වා ගැනීම
-ද්‍රව්‍ය නැවත නැවත භාවිතයට ගැනීම හා ප්‍රතිචක්‍රීකරණය

47. -පිරිවැටුම වර්ධනය කර ගැනීමට
-ලාභය වර්ධනය කර ගැනීමට
-කීර්තිනාමය වර්ධනය කර ගැනීමට
-අවදානමට සාර්ථකව මුහුණ දීමට
-නිෂ්පාදිත විවිධාංගිකරණයට

48. -ව්‍යාපාරයේ මුදල් හොඳින් පාලනය කළ හැකි වීම
-ණය වීම වළක්වා ගත හැකි වීම
-මුදල් ඉතිරි කරමින් අනාගතය සැලසුම් කළ හැකි වීම
-මූල්‍ය ස්ථාවරත්වය ඇති කර ගත හැකි වීම
- මූල්‍ය සම්පත් ඵලදායීව ආයෝජනය කිරීම

49. -අයදුම්පත් ඇගයීම
-සම්මුඛ පරීක්ෂණ
-බුද්ධි පරීක්ෂණ
-පෞරුෂත්ව පරීක්ෂණ
-ප්‍රායෝගික පරීක්ෂණ
-වෛද්‍ය පරීක්ෂණ
-පසුබිම් පරීක්ෂණ

50. - ශක්තිමත් මුරපද භාවිත කිරීම
- මුරපද හුවමාරු කර නොගැනීම
- නොදන්නා වෙබ් අඩවිවලට E mail, සබැඳිවලට ඇතුළු නොවීම
- එක්වරක් පමණක් භාවිත කරන මුරපද (OTP) හුවමාරු කර නොගැනීම
- බහු සාධක සත්‍යාපනය (Multi factor authentication)
- මෘදුකාංග යාවත්කාලීන කිරීම
- මූල්‍ය ගිණුම් නිරන්තරව පරීක්ෂා කිරීම
- ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව , 2026

கல்விப் போதுத் தராதரப் பத்திர (உயர் தரப்) கற்றலுக்கான உதவி மதிப்பீடு , 2026

General Certificate of Education (Adv. Level) Supportive Assessment, 2026

ලකුණු දීමේ පටිපාටිය

ව්‍යාපාර අධ්‍යයනය	II
வணிகக் கல்வி	II
Business Studies	II

32 **S** **II**

ප්‍රශ්න අංක 1

I (අ) ප්‍රාථමික අංශය
තෘතීයික අංශය (කරුණකට 1x2 = ලකුණු 02)

(ආ) 1. කර්මාන්ත අංශය --පතල් හා කැණීම් කටයුතු සිදු කිරීම
2. සේවා අංශය --දේශීය හා විදේශීය වෙළඳපොලේ මැණික් අලෙවි කිරීම. (කරුණකට 1x2 = ලකුණු 02)

II (අ) 1. පියාගෙන් ලැබුණු ව්‍යාපාරික දැනුම සහ අත්දැකීම්.
2. මැණික් හා පතල් කර්මාන්තය පිළිබඳ ඔහු සතු දැනුම
3. පුහුණු අත්දැකීම් සහිත සේවකයන් 15 ක් සිටීම. (කරුණකට 1x2 = ලකුණු 02)

(ආ) 1. රජයේ නීති රීති දැඩි වීම
2. පරිසරය සම්බන්ධ ආයතනවල බලපෑම
3. පරිසර සංවිධානවලින් එල්ල වන අභියෝග.
4. වෙළෙඳපොළ තරගකාරීත්වයට මුහුණ දීමට සිදුවීම.
5 රජය විසින් විවිධ බදු පැනවීම.
6 මැණික් වෙනුවට ආදේශක වෙළෙඳපොළට හඳුන්වා දීම (කරුණකට ½ x4 = ලකුණු 02)

III (අ) 1. යෙදූ සම්පත් සඳහා ප්‍රමාණවත් ඉපයීමක් ලබා ගැනීමට/අයිතිකරුවන්ට ප්‍රතිලාභ ලබාදීමට
2. ව්‍යාපාරයේ ප්‍රති ආයෝජනය කිරීම මගින් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා/ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සඳහා
3. අයිතිකරුවන්ට හා සේවකයන්ට අභිප්‍රේරණයක් ලබාදීමට
4. සුධාරගේ පෞද්ගලික තෘප්තිය සඳහා
5. සමාජ සුභ සාධනය සඳහා වැය කිරීමට
6. සේවකයන්ට අතිරේක ප්‍රතිලාභ (Bonus) ලබාදීමට හා සුබ සාධන කටයුතු සඳ

(කරුණකට ½ x4 = ලකුණු 02)

. (ආ) 1. රැකියා නියුක්තියට දායකවීම

2. රජයට නිසි පරිදි බදු ගෙවීම

3. අපද්‍රව්‍ය කළමනාකරණය

4. ප්‍රජා සත්කාර සේවා

5. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

6. (පිළිගත හැකි වෙනත් පිළිතුරු) (කරුණකට ½ x4=ලකුණු 02)

IV (අ) 1. ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ඉහළ යාම

2. ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම තහවුරු වීම

3. මූල්‍ය අක්‍රමිකතා හා විෂමාචාර පිටුදැකීමට හැකිවීම

4. නීතිමය බලපෑම් අඩුවීම

5. විවිධ පාර්ශ්වයන්ගෙන් එල්ල විය හැකි තර්ජන අවම වීම

6. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගය ලැබීම. (කරුණකට ½ x4=ලකුණු 02)

(ආ) 1. නිසි පරිදි බදු ගෙවීම

2. දේශීය සම්පත් භාවිතය

3. රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම

4. සේවා නියුක්තියට දායකවීම

5. පරිසරයට වන හානිය අවම කිරීම

6. නීති රීති පිළිපැදීම (කරුණකට ½ x4=ලකුණු 02)

V (අ) ඍජු බදු - පුද්ගලයන්ගේ හෝ ව්‍යාපාරවල ආදායම මත හෝ වත්කම් මත අය කරනු ලබන, ගෙවන පුද්ගලයා විසින්ම බදු බර දැරිය යුතු බදු මෙසේ හැඳින්වේ.

නිදසුන් - පුද්ගල ආදායම් බදු, රඳවා ගැනීමේ බදු, ප්‍රාග්ධන ලාභ බදු, සමාගම් බදු.

වක්‍ර බදු - භාණ්ඩ හා සේවා මත අයකරනු ලබන, ගෙවන ලද බද්ද වෙනත් පාර්ශ්වයක් වෙත විතැන් කළ හැකි බදු මෙසේ හැඳින්වේ.

නිදසුන් - එකතු කළ අගය මත බද්ද, නිෂ්පාදන බදු, රේගුබදු. (කරුණකට 1x2=ලකුණු 02)

(ආ) 1. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම

2. වගකීම කිහිප දෙනෙකු අතර බෙදී යාම

3. වෘත්තීය දක්ෂතා ඇති අය බඳවා ගත හැකිවීම

4. සාමූහික වගකීම නිසා උනන්දුව හා කාර්යක්ෂමතාව වැඩිවීම

5. සාමූහිකව තීරණ ගත හැකි වීම. (කරුණකට ½ x4=ලකුණු 02)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ප්‍රශ්න අංක 2

I (අ) 1. සීමා සහිත සමාගම්
2. සීමා රහිත සමාගම්
3. ඇපයෙන් සීමිත සමාගම් (2ක් නම් කිරීමට ලකුණු 1) (2ක් පැහැදිලි කිරීමට ලකුණු 01)

(ආ) එකඟ නොවේ. (ලකුණු 1/2)
සීමිත පොදු සමාගම් කොටස් වෙළෙඳපොලේ ලියාපදිංචි වීම අනිවාර්ය නොවේ.ලැයිස්තුගත වීම සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත මත සිදුවේ. ලියාපදිංචි වන සමාගම් ලැයිස්තුගත සමාගම් ලෙස හඳුන්වයි.
(ලකුණු 01 ½)

II (අ) 1. සමාගම් ලියාපදිංචි කිරීමේ බලතල
2. වාර්ෂික වාර්තා හා ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමේ බලතල
3. පනතේ විධිවිධාන වලට අනුකූල නොවන්නේ නම් සමාගම් නාමලේඛනයෙන් නම ඉවත් කිරීමේ බලතල
4. සමාගමේ කටයුතු අධීක්ෂණය හා ඒ සඳහා පරීක්ෂකවරු පත්කිරීම
5. කොටස් හා ණයකර සම්බන්ධයෙන් සීමා පැනවීම. (කරුණකට ½ x4=ලකුණු 02)

(ආ) 1. මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම
2. සමූපකාර ප්‍රතිපත්ති මතම පිහිටා කටයුතු කිරීමට සිදුවීම
3. නව තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා නොගැනීම
4. සීමිත කාලයක් පමණක් විවෘතව පැවතීම
5. දේශපාලන මැදිහත්වීම් පැවතීම
7 වර්තමානයට ගැලපෙන පරිදි නවීකරණය නොවීම (කරුණකට ½ x4=ලකුණු 02)

III (අ) 1. වරලත් ව්‍යාපාර ක්‍රමය ලබා ගැනීමට පිරිවැයක් දැරීමට සිදුවීම
2. ලාභය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයන් පැවතිය හැකිවීම
3. වරලත්ලාභියාට පූර්ණ ස්වාධීනත්වයක් හිමි නොවීම
4. වරලත්හිමියා අසාර්ථක වුවහොත් ආයෝජන සම්බන්ධයෙන් අවධානමක් පැවතීම
5. වරලත් ගිවිසුමට අනුව දැඩි පීඩනයකින් ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සිදුවීම.
(කරුණකට ½ x4=ලකුණු 02)

(ආ) 1. පෞද්ගලික අංශයේ ඒකාධිකාරී ආයතන බිහිවීම
2. පොදු ජනතාවට සාධාරණ මිලට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා නොසැපයීම
3. ජාතික ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වාගෙන යාමට නොහැකිවීම
4. අසාධාරණ ලාභ ලැබීමේ ඉඩකඩ වැඩිවීම (කරුණකට ½ x4=ලකුණු 02)

IV (අ) 1. ජාතික නිෂ්පාදිතය වර්ධනය වී ආර්ථික වර්ධනය ඇතිවීම
2. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වීම
3. රැකියා අවස්ථා නිර්මාණය වීම
4. වෙළෙඳපොළ අවස්ථා බිහිවීම
5. විදේශ විනිමය ඉපයීමට හැකිවීම
6. නවෝත්පාදන බිහිවීම (කරුණකට ½ x4=ලකුණු 02)

(ආ) 1. ස්වයං ඇගයීම
2. පුහුණුව
3. ව්‍යවසායකත්ව අධ්‍යාපනය
4.අත්දැකීම් වලින් ප්‍රයෝජන ලැබීම (කරුණකට ½ x4=ලකුණු 02)

V (අ) 1. සේවක සංඛ්‍යාව
2. ආයෝජිත ප්‍රාග්ධනය
3. වාර්ෂික පිරිවැටුම
4. විදුලිබලධාරිතාවය
5. නිෂ්පාදන ධාරිතාවය (කරුණකට ½ x4=ලකුණු 02)

(ආ) 1. මූල්‍ය පහසුකම්
2. උපදේශන සේවා
3. යටිතල පහසුකම්
4. අලෙවි පහසුකම්
5. පර්යේෂණ හා තාක්ෂණික පහසුකම් (කරුණකට ½ x4=ලකුණු 02)

ප්‍රශ්න අංක 3

I (අ) 1. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
2. වටිනාකම මැනීමේ මිම්මක් ලෙස කටයුතු කිරීම.
3. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම.
4. විලම්බිත ගෙවීම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම. (කරුණකට ½ x4=ලකුණු 02)


(ආ) විනිමය මාධ්‍යයක් ලෙස හා වටිනාකම මැනීමේ මිම්මක් ලෙස කටයුතු කිරීම යන කාර්යයන් ගැටලුවකට ලක් නොවීම. (ලකුණු 01)

- උද්ධමන වකවානුවක් තුළ මුදලින් ධනය රැස් කිරීමට පෙළඹෙන්නේ නැත. මුදලේ අගය අඩුවන නිසා.
- උද්ධමන වකවානුවක් තුළ විලම්බිත ගෙවීම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීමේදී ණය ගැතියාට වාසියකුත් ණය හිමියාට අවාසියකුත් සිදුවන නිසා. (ලකුණු 01)

II (අ) 1. මුදලේ පිරිවැය /පොලිය
2. මුදල් ප්‍රමාණය/ මුදල් සැපයුම/ද්‍රවශීලිතව (කරුණකට 1 x2 = ලකුණු 02)

(ආ) 1. කාලීන හා ඉතිරිකිරීමේ තැන්පත් භාරගැනීම.
2. විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයන්ට ණය සැපයීම.
3. සමාගම්වල කොටස් ප්‍රාරක්ෂණ කටයුතු කිරීම.
4. කල්බදු පහසුකම් සැපයීම.
5. කළමනාකරණ උපදේශන සේවා සැපයීම. (කරුණකට ½ x 4=ලකුණු 02)

(III)(අ)



(නියමිත ආකෘතියට ලකුණු 1, ආරක්ෂාව සඳහා ලකුණු 1)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ආ)

1. ආදායකයා විසින් චෙක්පත බැංකුවේ තැන්පත් කිරීමේදී
2. විධාන චෙක්පතක් නම් අන් අයකුට පවරන අවස්ථාවේදී
3. රේඛනය නොකරන ලද චෙක්පතක් බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීමේදී

(කරුණකට 1x2 =ලකුණු 02)

(IV)(අ) 1. පළමු පක්ෂය - රක්ෂිතයා

2. දෙවන පක්ෂය - රක්ෂකයා (කරුණකට ½ x2=ලකුණු 02)

ආ) රක්ෂණය හා සම්බන්ධ ගැටළුවක් ඇති වූ විට රක්ෂණ මූලධර්ම ඇසුරෙන් විසඳුම් ලබා ගත හැකි බව

රක්ෂණ ගිවිසුම ඇතිකර ගැනීමේදී මූලධර්ම පිළිබඳ අවබෝධයක් ඇති කර ගන්න නිසා ගැටළු ඇති කර නොගැනීම / ගැටළු ඇති නොවීම

රක්ෂණය සුදුවකින් වෙන් කරන බව

මූලධර්ම තුනක් මගින් පැහැදිලි කර තිබීම (ලකුණු 03)

(V)(අ)

1. පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීමට
2. විකුණුම් වැඩි කර ගැනීමට
3. ආයතනික අභ්‍යන්තර කටයුතු පහසු කර ගැනීමට
4. බාහිර පාර්ශ්ව සමඟ සබඳතා ගොඩනඟා ගැනීමට
5. ප්‍රතිපෝෂණය මඟින් දැනුවත් වීමට
6. කීර්තිනාමය ගොඩනඟා ගැනීමට

(කරුණකට ½ x4=ලකුණු 02)

v (ආ) පණිවුඩය යවන්නාගේ වගකීම්:

1. පැහැදිලි අදහසක් හදා ගැනීම / ගොඩනැඟීම
2. නිවැරදි ව ආකේතනය කිරීම
3. සුදුසු මාධ්‍යයක් තෝරා ගැනීම
4. නිවැරදි ව හා සම්පූර්ණ ව පණිවිඩය දීම
5. ප්‍රතිපෝෂණය අපේක්ෂා කිරීම/ ලබා ගැනීම (එකකට ලකුණු ½ x2=ලකුණු 01)

පණිවුඩය ලබන්නාගේ වගකීම්:

1. අවධානයෙන් ඇසීම / සවන්දීම
2. නිවැරදි ව විකේතනය කිරීම
3. පූර්ව නිගමනවලට නොපැමිණීම
4. පැහැදිලි කර ගැනීම
5. ඉක්මනින් ප්‍රතිපෝෂණය ලබාදීම
6. රහස්‍ය බව සුරැකීම (එකකට ලකුණු ½ x2=ලකුණු 01)

ප්‍රශ්න අංක 4

I (අ) එකඟ වේ. (ලකුණු 1/2)

- මාර්ගය
- මාධ්‍ය
- බලය
- පර්යන්තය යන මූලිකාංග හතරම දියුණු කිරීම තුළින් ප්‍රවාහන සේවාවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හැකිබව

(ලකුණු 01½)

(ආ) 1. නාගරික මාර්ග තදබදය අඩු වීම
2. ඉන්ධන භාවිතය අවම කර ගත හැකි වීම
3. වායු දූෂණය අඩු වීම
4. කාලය ඉතිරි වීම
5. නගරයේ වාහන තදබදය අවම වීම .
6. පොදු ප්‍රවාහනය දියුණු වීම / දිරිමත් වීම
7. මාර්ග අනතුරු අඩු වීම (කරුණකට ½ x4=ලකුණු 02)

II (අ) 1. තොග ලැබීම
2. හඳුනා ගැනීම
3. පරීක්ෂා කිරීම
4. නිවැරදි බව තහවුරු කර ගැනීම
5. ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම
6. ඉවත් කිරීම
7. නිකුත් කිරීම සඳහා නැවත ලබා ගැනීම (ලකුණු 02)

(ආ) 1. මිල සටහන් කිරීම.
2. කිරුම් මිනුම් ක්‍රම.
3. ගෙවීම් ක්‍රම
4. නිරීක්ෂණ ක්‍රම

(කරුණකට ½ x4=ලකුණු 02)

III (අ) 1. රේගුව
2. අපනයන කරුගේ රටේ පිළිගත් රාජ්‍ය ආයතනයක්
3. ආනයනකරුගේ රටේ වාණිජ බැංකුවක්
4. ගුදම් අධිකාරීන් (කරුණකට ½ x4=ලකුණු 02)

(ආ) 1. අදාළ භාණ්ඩ තොගය නැවට භාර දුන් බව සනාථ කිරීමට
2. අපනයන භාණ්ඩ සඳහා මුදල් ලබා ගැනීමට
3. නීතිමය කටුතු සඳහා (ලකුණු 01x2=2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(IV) (අ) 1. ජාත්‍යන්තර වෙළෙඳාමේ බාධා ඉවත් කිරීම

2. වෙළෙඳ ආරවුල් සාමකාමීව විසඳීම

3. නිදහස් හා සාධාරණ වෙළෙඳාමක් ඇතිකිරීම.

4. සංවර්ධනය වෙමින් පවතින රටවලට උදව් කිරීම.

5. වෙළෙඳ ප්‍රතිපත්ති විනිවිදභාවයෙන් පවත්වා ගැනීම.

6. ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා රැකියා උත්පාදනය

7. සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම හා තිරසර සංවර්ධනය (ලකුණු 02) (එකකට ලකුණු 1 බැගින්)

(ආ) 1. විදේශ විනිමය ඉපයීම

2. වෙළෙඳපොළ පුළුල් කර ගැනීම

3. ජාත්‍යන්තර සබඳතා පුළුල් කර ගැනීම / ඇතිකර ගැනීම

4. දේශීය වෙළෙඳපොළේ පවතින තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීම

5. නිෂ්පාදන පරිමාණය ඉහල යාම

6. ජාතික අදායම වර්ධනයට දායක විය හැකිය (ලකුණු 02) (එකකට ලකුණු1 බැගින්)

(V) පාරිභෝගිකයින් මුහුණ දෙන ගැටලු

1. ඇණවුම් කළ භාණ්ඩ ම නොලැබීම.

2. තෝරා ගැනීමකට ඇති ඉඩකඩ අහිමිවීම (භෞතිකව භාණ්ඩ පරීක්ෂා කර බැලීමට නොහැකිවීම)

3. ඇණවුම් කල භාණ්ඩ වෙලාවට නොලැබීමට ඉඩ තිබීම (ලකුණු 02) (එකකට ලකුණු 1 × 2)

ව්‍යාපාරිකයින් මුහුණ දෙන ගැටලු -

1. මුදල් ලැබීම ප්‍රමාද වීමට ඉඩ තිබීම

2. තාක්ෂණික මෙවලම් අවශ්‍ය වීම

3. භාණ්ඩවලට හානි සිදු වීමට ඉඩ තිබීම

4. ඇණවුම් සිදු කලද භාණ්ඩ ලබා නොගැනීම (ලකුණු 02) (එකකට ලකුණු 1 × 2)

ප්‍රශ්න අංක 5

I (අ) 1. ව්‍යාපාර කටයුතු, රාජකාරි හා වගකීම් පැහැදිලි ලෙස බෙදා නොතිබීම.
2. කළමනාකරණ මට්ටම් පැහැදිලිව නොවීම.
3. සමායෝජන දුර්වලතා
4. දුර්වල සේවක අධීක්ෂණය
5. සන්නිවේදන දුර්වලතා. (කරුණකට ½ x4=ලකුණු 02)

(ආ) 1. පැහැදිලිව නිශ්චය කරගත් පරමාර්ථ හා අරමුණු මත පදනම් වීම
2. නිශ්චිත කාල සීමාවක් සඳහා සීමා වීම
3. ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි වීම
4. නම්‍යශීලිත්වය
5. ආයතනයේ සෑම මට්ටමක සේවකයන්ට තේරුම්ගත හැකි වීම
6. ප්‍රමුඛත්වය
7. සෑම මට්ටමක කළමනාකරුවන්ගේ කැප වීම හා සහභාගිත්වය අවශ්‍ය වීම
8. කාර්යක්ෂමතාව රැකිය යුතු වීම
9. පිරිවැය අභිබවා ප්‍රතිලාභ ලැබිය හැකි වීම (කරුණකට ½ x4=ලකුණු 02)

II (අ) 1. සේවක කාර්යක්ෂමතාව වැඩි කිරීමට - එක් එක් සේවකයා විශේෂිත කාර්යයන්ට හුරුවීමෙන් වැඩ ඉක්මනින් කල හැකි වේ.

2. විශේෂීකරණය වර්ධනය සඳහා

3. වියදම් අඩු කිරීමට (කාර්යක්ෂමතාව වැඩි නිසා පිරිවැය හා නාස්තිය අඩු වීම)

4. නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි කිරීමට (විශේෂඥයින් කාර්යයන් ඉටු කරන නිසා ගුණාත්මකභාවය වැඩි කිරීමට.)

5. විකුණුම් වැඩි කර ගැනීමට.

6. වගකීම් වඩා හොඳින් පැහැදිලි කර ගැනීමට. (කරුණකට1x2=ලකුණු 02)

(ආ) 1. වගකීම් නිසි ලෙස බෙදා දීම

2. වඩා හොඳ සන්නිවේදනයක් ඇති කිරීම

3. නිරන්තර සාකච්ඡා පසුවිපරම් පැවැත්වීම. (කරුණකට 1x2=ලකුණු 02)

III (අ) කළමනාකරණ මට්ටම් සහ කුසලතා(Diagram Text)


කළමනාකරණ මට්ටම



(ලකුණු 01)

කළමනාකරණ කුසලතා

සංකල්පනාත්මක / මානව / තාක්ෂණික



(ලකුණු 01)

මෙම රූපය නොමැතිව පැහැදිලි කර තිබුනද ලකුණු දෙන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ආ) අභිප්‍රේණ ගැටලු සහ ක්‍රම

අභිප්‍රේරණ ගැටලු	ක්‍රම
• වැටුප් හා දීමනා සම්බන්ධ ගැටලු • රැකියා සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලු • රාජකාරි නිසි ලෙස පැහැදිලි නොවීම • අභිප්‍රේරණ ක්‍රම ක්‍රියාත්මක නොවීම	• දීමනා හා වැටුප් වැඩි කිරීම / ප්‍රසාද දීමනා ලබාදීම / අතිකාල ගෙවීම්ක්‍රම ඇති කිරීම. • රැකියා උසස්වීම් ලබාදීම හා රැකියා සුරක්ෂිතභාවය ඇති කිරීම • රැකියා විස්තරය හා පිරිවිතරය අනුව රාජකාරි පැවරීම • විවිධ සේවක අභිප්රේරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම

(අභිප්‍රේරණ ගැටලු ½ x 2 = 1,අභිප්‍රේරණ ක්‍රම ½ x 2 = 1)

IV (අ) ක්‍රියාවලි පිරියත (ලකුණු 02)

(ආ) ව්‍යාපාරිකයාට අත්වන වාසි

1. ඉඩකඩ ප්‍රශස්ත ලෙස භාවිත කිරීම.
2. අධීක්ෂණය පහසු වීම.
3. ගබඩාකරණය පහසු වීම. (ලකුණු 01x2=2)

පාරිභෝගිකයාට අත්වන වාසි

1. භාණ්ඩ තෝරා ගැනීම පහසු වීම.
2. කාලය ඉතිරි වීම. (ලකුණු 01x2=2)

V (අ) 1. අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය

2. පරිගණක වැඩසටහන්

3. තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය (ලකුණු 01x2=2)

(ආ) 1. නිෂ්පාදනය හා අලෙවිය අඛණ්ඩව පවත්වාගෙන යාම

2. ඌන හෝ අතිරික්ත හා තොග පවත්වා ගැනීමෙන් සිදුවන වියදම් අවම කිරීම

3. යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රමය ආදී සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

4. අනපේක්ෂිත ඉල්ලුම් තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීම

5. ගබඩා වියදම් අඩු කිරීමට, ගබඩා කිරීම රක්ෂණය හා නඩත්තු වියදම් පාලනය කිරීමට

6. නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට (ලකුණු ½ x2=2)

ප්‍රශ්න අංක 6

I (අ) විෂම ගති ලක්ෂණ වලින් යුතු සමස්ත වෙළෙඳපොළ සමාන ගති ලක්ෂණවලින් යුතු පාරිභෝගික කාණ්ඩවලට බෙදා වෙන් කිරීමයි (ලකුණු 01)

පදනම ප්‍රජා විද්‍යාත්මක පදනම (වයස, ආදායම) (ලකුණු 01)

(ආ)

ගැඹුර වැඩි කර ගැනීමට

1. විවිධ පලතුරු රස සහිතවීම නිෂ්පාදනය (ලකුණු 01)

ගැලපෙන උදාහරණ වලට ලකුණු දෙන්න

පළල වැඩි කර ගැනීමට

2. වියළි පලතුරු කැබලි ලෙස වෙළඳපලට ඉදිරිපත් කිරීම
3. පලතුරු පවුඩර් පැකට් ලෙස ඉදිරිපත් කිරීම (කරුණු 1 කට ලකුණු 01)

හෝ ගැලපෙන උදාහරණවලට ලකුණු දෙන්න

II(අ) වෙළඳපළ සාරය උරා ගැනීම වෙළඳපොළ ඉහළ ආදායම් ලබන තරුණ පිරිස ඉලක්ක කර ගැනීම (ලකුණු 01)

(ආ) ප්‍රාථමික ඇසුරුම සහ ප්‍රවාහන ඇසුරුම. (ලකුණු 01 x 2 = 2)

III(අ) පාරිභෝගික භාණ්ඩ යටතේ පහසු භාණ්ඩ (ලකුණු 01)

හේතු

1. එදිනෙදාට ගත හැකි වීම
2. මිලට ගැනීමට දැරී යුතුයි වෙහෙස අඩුවීම
3. භාණ්ඩ තේරීමට වැඩි කාලයක් ගත නොවීම (කරුණකට ලකුණු 01)

(ආ) ආයතන යොදාගන්නේ සෘජු අලෙවිකරණයයි (ලකුණු 01)

යොදාගත හැකි වෙනත් ප්‍රවර්ධනක් උපක්‍රම:

1. ප්‍රචාරණය
2. විකුණුම් ප්‍රවර්ධන ඉසව් හා අත්දැකීම් (ලකුණු ½ x2=1)

IV(අ)

1.දැඩි තරගකාරීත්වය
2. ඉලක්කම වෙළෙඳපොළ පටු වීම
3. ප්‍රවර්ධන උපක්‍රමවලින් දුර්වලතා
4. නිෂ්පාදනය විවිධාංගිකරණය නොවීම
5. මිල කිරීමේ ක්‍රමවල දුර්වලතා (ලකුණු 01x2=2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ආ)

1.ආයතනය ඍජුවම බෙදා හැරීම

2.අතරමැදියන් යොදාගෙන බෙදා හැරීම

3විකුණුම් සේවකයන් මගින් බෙදා හැරීම (ලකුණු 01x2=2)

V (අ)

1. වෙළඳ පොළ කොටස වැඩි කිරීමට
2. කොටස් හිමියන්ගේ ආයෝජනයේ වටිනාකම ඉහළ නැංවීමට
3. ව්‍යාපාරයේ දිගු කාලීන වර්ධනයට හානි ස්ථාවරත්වයන් තහවුරු කිරීමට
4. ආයෝජකයන්ගේ විස්වාසය විශ්වාසය තහවුරු කිරීමට
5. ව්‍යාපාරයේ ප්‍රධාන මූල්‍ය අරමුණු ඉටුකර ගැනීමට (ලකුණු 01x2=2)

(ආ)

ව්‍යාපාරික ලාභය	**අයිතිකරුවන්ගේ ධනය**
• වියදම ඉක්මවූ ආදායමයි • නිශ්චිත කාල පරිච්ඡේදයකට අනුව ගණනය කරයි • ලාභය ව්‍යාපාරික කාර්ය සාධනය මැනීමට උපකාරී වේ	• පුද්ගලයෙකුගේ හෝ ව්‍යාපාරයක් සතු සමස්ත වත්කම්වල වටිනාකමයි • ධනය නිශ්චිත අවස්ථාවල මනිනු ලබයි • ව්‍යාපාරයේ මූල්‍ය ශක්තිය හා හිමිකාරීත්වය පෙන්වයි

(ලකුණු 02)

ප්‍රශ්න අංක 7

I (අ) රාජ්‍ය සංස්ථා හා සීමිත පොදු සමාගම් මගින් මධ්‍ය හා දිගුකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා සාංගමික බැඳුම්කර නිකුත් කරන අතර, රජයට අවශ්‍ය මධ්‍ය හා දිගුකාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරයි.

(කෙටි පැහැදිලි කිරීමකට ලකුණු 02)

(ආ)

1. අපනයනකරුවන් ලබා ගන්නා විදේශ මුදල් වාණිජ බැංකුවලට විකුණා ශ්‍රී ලංකා රුපියල් ලබා ගැනීම.
2. ආනයනකරුවන් ශ්‍රී ලංකා රුපියල් ලබා දී විදේශ මුදල් ලබා ගැනීම.
3. ණයවර ලිපි නිකුත් කිරීම.
4. විදේශ බැංකු අණකර නිකුත් කිරීම. (ඕනෑම කරුණු 4 කට x½=ලකුණු 02)

II (අ) සමාගමක දැනට සිටින **සාමාන්‍ය කොටස් හිමියන්ට** කිසියම් අනුපාතයකට අනුව නව කොටස් නැවත ලබා දීමයි. හිමිකම් නිකුතුවකදී වෙළඳපොළේ මිලට වඩා අඩු මිලකට කොටස් ලබා ගැනීමේ අවස්ථාව අයිතිකරුවන්ට ලැබේ. (කෙටි විස්තරයකට ලකුණු 02)

(ආ)

1. අඩු මිලකට කොටස් හිමිකර ගැනීමට හැකි වීම.
2. අඩු මිලට ගත් කොටස් වැඩි මිලට විකුණා ප්‍රාග්ධන ලාභ අත්කර ගත හැකි වීම.
3. හිමිකාරිත්වය පුළුල්වීමක් සිදු නොවන නිසා ලාභාංශ බෙදී නොයාම (ඕනෑම 2x1= ලකුණු 02)

III (අ) 1. නව බඳවා ගැනීම් නතර කිරීම.

2. ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමට අවසර දීම.
3. තාවකාලිකව සේවකයන්ගේ වැඩ නැවැත්වීම.
4. වැඩ කරන පැය ගණන අඩු කිරීම. (2x½=ලකුණු 01)

(ආ) 1. නව සේවකයන් බඳවා ගැනීම.

2. වර්තමානසේවකයන්අතිකාලවැඩවලනිරතකිරීම
3. ව්‍යාපාර කටයුතු බාහිරව පැවරීම (outsource)
4. නව තාක්ෂණය භාවිතා කිරීම
5. සේවාදායක වලන (2x½=ලකුණු01)

(ඇ) 1. අනාගත සේවාදායක අවශ්‍යතා තීරණය කළ හැකි වීම

2. අනාගත ශ්‍රම ඌණතා හා අතිරික්තතා හඳුනා ගත හැකි වීම
3. සේවාදායක පිරිවැය අඩු කර ගත හැකි වීම
4. සේවක සංවර්ධනය හඳුනාගත හැකි වීම (2x1ලකුණු 02)

IV (අ) සේවක දුක්ගැනිවිලි, සෞඛ්‍ය හා ආරක්ෂාව (ලකුණු 02)

(ආ) 1. සේවකයන් ආයතනය හැර යාම

2. සේවක අභිප්‍රේරණයට බාධා පැමිණීම
3. වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ තිබීම
4. සේවා සේවක සබඳතා දුරස්ථ විය හැකි වීම (4x ½ =ලකුණු 02)

V. 1. සමාජ ප්‍රශ්න වර්ධනය වීම.

2. ජන ජීවිතය අඩාල වීම.
3. වෙළෙඳපොළේ භාණ්ඩ හිඟ වීම.
4. භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම
5. භාණ්ඩවල ගුණාත්මකභාවය පහළ යාම (4x1=ලකුණු04)

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

ප්‍රශ්න අංක 8

08. I (අ) ඩිජිටල් ආර්ථිකයක් යනු අන්තර්ජාලය, පරිගණක, ජංගම උපාංග සහ ඩිජිටල් සන්නිවේදනය යන ඩිජිටල් තාක්ෂණයන් භාවිතයෙන් සියලුම ආර්ථික කටයුතු සිදු වන ආර්ථිකයකි. (ලකුණු 02)

(ආ)
1. සයිබර් ප්‍රහාර පිළිබඳ අවදානම.
2. සෑම කෙනෙකුටම අන්තර්ජාල පහසුකම් නොමැති වීම.
3. යටිතල පහසුකම් සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීම.
4. නව දැනුම අවශ්ය වීම.
5. විධිමත් ප්‍රතිපත්ති හා නීතිරීති ක්‍රියාත්මක නොවීම (4x½=ලකුණු02)

II (අ) තොරතුරු තාක්ෂණය යනු, විදුලි සංදේශ හා පරිගණක තාක්ෂණය ඔස්සේ වාචික, රූපමය, අක්ෂරමය හා අංකමය දත්ත අත්පත් කර ගැනීම, සැකසීම, ගබඩා කිරීම හා බෙදා හැරීම යි.
තොරතුරු කළමනාකරණ තාක්ෂණය යනු, ආයතනයක් සතු පරිගණක තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණය මැනවින් හසුරුවමින් තොරතුරු සම්පත්, සඵලදායී ව හා කාර්යක්ෂම ව භාවිතා කිරීම යි. ඒ අනුව තොරතුරු කළමනාකරණ තාක්ෂණය තොරතුරු තාක්ෂණයේ එක් ක්ෂේත්රයක් පමණි. (ලකුණු 02)

(ආ)
1. හඳුන්වා දීමේ දී අධික පිරිවැයක් දැරීමට සිදු වීම.
2. පුහුණු සේවකයන් අවශ්‍ය වීම.
3. ඉහළ වැටුප් ගෙවීමට සිදු වීමෙන් පිරිවැය ඉහළ යාම.
4. අපරාධ, වංචා දූෂණ ආදිය සිදු වීම.
5. පරිසර දූෂණයට බලපෑම. (4x ½ =ලකුණු 02)

III (අ) පණිවුඩ, දත්ත හා තොරතුරු හුවමාරු කිරීම ආදී කාර්ය ඉටු කර ගැනීමට පරිගණක දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කොට පොදුවේ කටයුතු කරන පද්ධතියකි. (ලකුණු 02)

(ආ)
1. දෘඩාංග පොදුවේ භාවිත කළ හැකි වීම
2. පොදු දත්ත පදනමක් (Data base) භාවිත කළ හැකි වීම
3. තීරණ ගැනීමට තොරතුරු පහසුවෙන් හුවමාරු කළ හැකි වීම
4. තොරතුරු ගබඩා කිරීමට අඩු ඉඩක් හා කාලයක් වැය වීම.
5. සන්නිවේදනය කාර්යක්ෂම වීම.
6. ඕනෑම ස්ථානයක සිට දත්තවලට ප්‍රවේශ විය හැකි වීම. (4x ½ ලකුණු 02)

IV (අ)
1. පවතින තරගකාරිත්වය
2. තරගකරුවන් සහ ඔවුන්ගේ ශක්තීන්
3. තරගකාරිත්වයට මුහුණ දීමට තමා සතු ශක්තීන් හා දුර්වලතා
4. වෙළෙඳපොළට පිවිසීමට ඇති බාධා. (4 x 1/2 - ලකුණු 02)

(ආ)

1. ඇස්තමේන්තුගත පිරිවැය
2. ආදායම් ප්‍රකාශය
3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
4. ණය ආපසු ගෙවීමේ සටහන
5. ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (4x½ලකුණු02)

V. (අ) සමාජයේ සියලුම කණ්ඩායම් විධිමත් මූල්‍ය පද්ධතියට ඇතුළත් කිරීමේ අරමුණින් සියලුම පුද්ගලයන්ට හා ආයතනවලට විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී කණ්ඩායම් හෝ ග්‍රාමීය ප්‍රජාවට දැරිය හැකි හා ගැලපෙන මූල්‍ය සේවා සඳහා ප්‍රවේශයක් සැපයීම. (ලකුණු 02)

(ආ)

1. මූල්‍ය සාක්ෂරතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. ක්ෂුද්‍ර මූල්‍යකරණ වැඩසටහන් ව්‍යාප්ත කිරීම.
3. ජංගම බැංකු (mobile banking) කටයුතු ව්‍යාප්ත කිරීම.
4. බැංකු කටයුතු සරල කිරීම.
5. මූල්‍ය යටිතල පහසුකම් වර්ධනය කිරීම.
6. මූල්‍ය පද්ධතිය තුල ආයෝජකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
7. මූල්‍ය තාක්ෂණ නවෝත්පාදන (Fin-tech Innovation) හඳුන්වා දීම

(4 x ½ ලකුණු 02)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න